# රජයේ නිවේදනයයි

## 2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනත

## 2 වැනි වගන්තිය යටතේ නියමය

2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 2 වැනි වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල්, ආර්ථික සහ ප්‍රතිපත්ති සංවර්ධන අමාත්‍ය මහින්ද රාජපක්ෂ වන මම, මෙහි උපලේඛනයේ I වන තීරයේ නිශ්චිතව දක්වා ඇති වෙළඳ භාණ්ඩ සම්බන්ධයෙන් ඒ උපලේඛනයේ II වන තීරයේ අනුරූප සටහන් වල නිශ්චිතව දක්වා ඇති අනුප්‍රමාණය මත විශේෂ වෙළඳ භාණ්ඩ බද්දක්, මෙම නියමය මගින් පනවමි.

මෙම නියමය 2020 ජූලි මස 19 දින සිට ආරම්භ වන මාස 06 ක් දක්වා වූ කාල සීමාවක් සඳහා, 2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 2 වැනි වගන්තියේ (3) වන උපවගන්තියේ විධිවිධාන වලට යටත්ව, වලංගුව පැවතිය යුතුය.

මහින්ද රාජපක්ෂ
මුදල්, ආර්ථික සහ ප්‍රතිපත්ති
සංවර්ධන අමාත්‍ය

2020 ජූලි මස ..18... වන දින
කොළඹ 01,
මුදල්, ආර්ථික සහ ප්‍රතිපත්ති සංවර්ධන අමාත්‍යාංශයේදීය.

### උපලේඛනය

| I වන තීරය | | | | II වන තීරය |
|---|---|---|---|---|
| වෙළඳ භාණ්ඩය | | | | විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද |
| | සං. ව. ශීර්ෂය | සං. ව. සංකේතය | විස්තරය | |
| 01 | 03.05 | 0305.59.10 | උම්බලකඩ සහ ඒ සදහා ආදේශක | කි.ග්‍රෑමයට රු. 102.00 |
| 02 | 04.06 | 0406.20 | සියළුම වර්ගවල, පෙරන් ගාන ලද හෝ පිටි කරන ලද කේජු | කි.ග්‍රෑමයට රු. 200.00 |
| 03 | 09.09 | 0909.21 | කොත්තමල්ලි බීජ - කුඩු නොකළ හා නොඇඹරූ | කි.ග්‍රෑමයට රු. 26.00 |
| | | 0909.22 | කොත්තමල්ලි බීජ - කුඩු කළ හෝ ඇඹරූ | කි.ග්‍රෑමයට රු. 52.00 |
| 04 | 09.10 | 0910.30.10 | කහ - කුඩු නොකළ හා නොඇඹරූ | කි.ග්‍රෑමයට රු. 102.00 |
| | | 0910.30.90 | කහ - අනෙකුත් | කි.ග්‍රෑමයට රු. 360.00 |
| 05 | 11.06 | 1106.10.10 | උදු පිටි | කි.ග්‍රෑමයට රු. 325.00 |